**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

**I වාර පරීක්ෂණය - 2008**

**භූගෝල විද්‍යාව - 10 ශ්‍රේණිය**

**කාලය පැය 01**

---

## <u>I කොටස</u>

**එක් එක් ප්‍රශ්නය සඳහා සපයා දී ඇති උපදෙස් වලට අනුකූලව සියළුම ප්‍රශ්ණ වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

**අංක 1-9 දක්වා ප්‍රශ්ණ වලට හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුලින් තෝරා ලියන්න.**

1. උෂ්ණත්වය, පීඩනය, සුළං, ආර්ද්‍රතාවය, වලාකුළු වර්ධනය වැනි සියළු සංසිද්ධි ඇති වන්නේ ......................................... ගෝලයේය. (පරිවර්තී, අපවර්තී, මෙසෝ)

2. සාගර ජලයේ 1000 ට ......................................... ක ලවණතාවයක් පවතී (35, 10, 45)

3. ජල ගෝලයේ අඩංගු මුළු ජල ප්‍රමාණය ඝණ කි.මි. මි ......................................... පමණ වේ යයි (ගණන් බලා ඇත. (1200, 1360, 1660, 1260)

4. පරිවර්තී ගෝලය සමකය ආසන්නයේදී උස කි.මි. ......................................... පමණ වන අතර ධ්‍රැව ප්‍රදේශ වලදී උස කි.මී. ......................................... පමණ වේ. (20/80, 17/8, 12/8, 15/8)

5. එකිනෙකට විරුද්ධ දිශාවන්ට ගමන් ගන්නා ආකාරයේ තැටි මායිම් .........................................මායිම් වේ. (අපසරණ, අභිසරණ, තිර්යක්)

6. භූමි කම්පා ආරම්භ වන්නේ පෘථිවි පෘෂ්ඨයේ සිට කි.මී. ......................................... පමණ අභ්‍යන්තරයෙනි. (50 60, 30 40, 20 30)

7. ලෝකයේ උසම සානුව ......................................... (පාමීර්, ඩෙකෑන්, මෙසීටා)

8. ශ්‍රී ලංකාවේ සිංහරාජ වනාන්තරය ලෝක උරුමයක් බවට පත්කලේ ......................................... වසරේය. (1978, 1988, 1989)

9. නයිල් ගඟ උපත ලබන විල ......................................... (වික්ටෝරියා, මලාවි, චැඩ්)

**අංක 10-19 දක්වා දී ඇති එක් එක් ප්‍රකාශය හොඳින් කියවා නිවැරදි නම් "නි" යන්න වටාද වැරදි නම් "වැ" යන්න වටාද රවුමක් අඳින්න.**

10. ශිලා ගෝලය පෘථිවිය පුරා සෑම තැනකදීම එක සමාන ඝනකමකින් යුක්ත වේ. නි/වැ

11. මුහුදු මට්ටමේ සිට කි.මී. 29 ක පමණ සීමාව ඇතුලත වායු ගෝලීය වායු ස්කන්ධයෙන් 97%ක් පමණ ඇතුලත් වේ. නි/වැ

12. ජාත්‍යන්තර දින රේඛාව වැටී ඇත්තේ දේශාංශ 180 ඔස්සේය. නි/වැ

13. මහද්වීප නිර්මාණය වී ඇත්තේ සියල් පාෂාණ ස්ථරයෙනි. නි/වැ

14. අභිසරණ තැටි මායිම් ක්‍රියාත්මක වීමෙන් විශාල රැළි කඳු නිර්මාණය වේ. නි/වැ

15. ග්‍රැනයිට් පාෂාණ සෑදී ඇත්තේ සිලිකන් ඔක්සයිඩ් හා ඇලුමිනියම් ඔක්සයිඩ් සංයෝගයෙනි. නි/වැ

16. හිමාලය හා අන්දීස් කඳුවැටි අභිසරණ භූතැටි ක්‍රියාකාරීත්වය නිසා ඇතිවූ ඒවාය. නි/වැ

17. පහත් භූමියකට මුදුදකට අභ්‍යන්තර ජලාශයක් දෙසට යොමුවන දිගැටි හැඩයේ අවගතයක් නිම්නයක් නම් වේ. නි/වැ

18. ප්‍රධාන ගංගාවකට අතු ගංගා එකතු වීමෙන් ගංගා මණ්ඩලයක් ඇතිවේ. නි/වැ

19. ප්‍රාවරණය මැන්ටලය යන නමින්ද හැඳින්වේ. නි/වැ

**20-29 දක්වා වාක්‍යවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

20. පෘථිවි පෘෂ්ඨයේ ඉහලම ස්ථරය .......................................... වේ.

21. පරිවර්ති ගෝලයේදී දක්නට ලැබෙන පතන සීඝ්‍රතාව මුහුදු මට්ටමේ සිට ඉහල නගින සෑම මීටර් 1000ටම .......................................... බැගින් වේ.

22. ගොඩබිමෙන් සම්පූර්ණයෙන් වටවූ මිරිදියෙන් පිරුණු ජලාශ .......................................... නමින් හඳුන්වනු ලැබේ.

23. පෘථිවි ආරම්භය හා අවයාධික පාෂාණ නිර්මාණය වූ අවධියේ සිට අද දක්වා දක්නට ලැබෙන භූගත ජලය .......................................... නම් වේ.

24. සාගර පතුල් සෑදී ඇත්තේ .......................................... පාෂාණ වලිනි.

25. පෘථිවි පාෂ්ඨයේ දක්නට ලැබෙන යුරේනියම් කොමියම් නිකල් හා මොනසයිට් .................................. ඛණිජ වර්ග වේ.

26. තැටි භූ කාරක කල්පිතය ඉදිරිපත් කලේ බ්‍රිතාන්‍ය ජාතික .......................................... විසිනි.

27. නැවත විදරණයක් ඇති නොවේ යයි සලකන යමහල් ........................................... යනුවෙන් හඳුන්වනු ලැබේ.

28. සම මුදුනකින් හෝ ආසන්න සමතාවයකින් යුතු මුදුන් සහිත කඳු වලින් යුතු උස් සම බිම ........................................... නම් වේ.

29. මෙසෝ ගෝලය හා තාප ගෝලය වෙන් කරන සීමාව ........................................... මණ්ඩලය නම් වේ.

**30-39 දක්වා ප්‍රශ්ණ සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

30. වායුගෝලයේ පිහිටි ඕසෝන් ස්ථරය මඟින්
   1. ගෝලීය උණුසුම පාලනය කෙරේ.
   2. සූර්යාගෙන් පහල වායුගෝලයට එන අහිතකර කිරණ පාලනය කෙරේ.
   3. කැටි වළාකුළු නිර්මාණය කෙරේ. (.............)

31. යාපන අර්ධද්වීපයේ මතුපිට ජලවහන රටාවක් දක්නට නොලැබෙන්නේ එහි,
   1. පවතින දැඩි උෂ්ණත්වය නිසාය
   2. හුණුගල් සහිත භූ ව්‍යුහය නිසාය.
   3. වාෂ්පීකරණය අධික නිසාය. (.............)

32. රිච්ටර් පරිමාණය භාවිතා කරන්නේ,
   1. වායු පීඩනය මැනීමටය
   2. සුළගේ වේගය මැනීමටය
   3. භූමි කම්පා තීව්‍රතාව මැනීමටය. (.............)

33. පූජියාමා, කැකටෝවා, එඩ්නා යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
   1. යමහල් කලාප වේ.
   2. ගිනි කඳු වේ.
   3. විල් කීපයකි. (.............)

34. පෘථිවි පෘෂ්ඨයේ සිට කි.මී. 300-700 දක්වා ගැඹුරට විහිදේ. උෂ්ණත්වය $5000^0$c පමණ වේ. මේ කලාපය වන්නේ,
   1. ඉහළ ප්‍රාවරණය
   2. පහළ ප්‍රාවරණය
   3. අභ්‍යන්තර හරය (.............)

35. ජූනි මස වන විට සීත සෘතුව උදාවන්නේ මින් කුමන කලාපයටද?
   1. කර්කටක නිවර්තනය ආශ්‍රිතව
   2. මකර නිවර්තනය ආශ්‍රිතව
   3. සමක ආශ්‍රිත (.............)

36. සුනාමි තත්වයක් ඇතිවීම කෙරේ බලපාන්නේ මින් කවරේක්ද?

1. මුහුදේ ප්‍රචන්ඩ කුණාටු ඇතිවීම.
2. මුහුදු පත්ලේ ඇතිවන භූමි කම්පා
3. ගිනිකඳු පුපුරා මුහුදට ලාවා ගලා යාම. (............)

37. වායු ගෝලයේ පෘථිවියට ආසන්නම වායු ස්ථරය මේ නමින් හැඳින්වේ.

1. අපවර්තී ගෝලය
2. මෙසෝ ගෝලය
3. පරිවර්ති ගෝලය (............)

38. අඹේවෙල හා හෝර්ටන් වැනි තැනි ප්‍රදේශවල දක්නට ලැබෙන් තණ බිම් මේ නමින් හැඳින්වේ.

1. තෙත් පතන
2. විල්ලු
3. වියළිපතන (............)

39. සෞරග්‍රහ මණ්ඩලයේ සූර්යාට දුරින්ම පිහිටා ඇති ග්‍රහලෝකය වන්නේ,

1. නෙප්චූන්
2. බුධ
3. සෙනසුරු (............)

(ලකුණු 40)

රාජකීය විද්‍යාලය - කොළඹ 07

I වාර පරීක්ෂණය - 2008

භූගෝල විද්‍යාව - 10 ශ්‍රේණිය

කාලය පැය 02

## II කොටස

පළමුවන ප්‍රශ්ණයටත් 2-4 දක්වා ප්‍රශ්ණ වලින් ප්‍රශ්ණ දෙකකටත් පිළිතුරු සපයන්න.

1. ලෝක ආකෘති සිතියමක ලකුණුකර නම් කරන්න.
   ටිටිකාකා විල, බයිකල් විල, කලහාරි කාන්තාරය, මහාවාලුකා කාන්තාරය, ඇට්ලස් කඳු, රොකී කඳු, බාස් සමුද්‍ර සන්ධිය, ඩේවිස් සමුද්‍ර සන්ධිය, සමකය, නැ.දේ. 80, කැනරි දූපත්, හවායි දූපත්, යොක් තුඩුව, සුභපැතිමේ තුඩුව, බොත්නියා බොක්ක, කාපරේයන් බොක්ක, මිසිසිපි ගඟ, නයිල් ගඟ, යුකටන් අර්ධද්වීපය, සෝමාලියාව (ලකුණු 20)

2. i. වායුගෝලයේ ස්ථර 4ක් නම් කරන්න. (ලකුණු 04)
   ii. වායුගෝලයෙන් පෘථිවියට ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 08)
   iii. ගෝලීය උණුසුම වැඩිවීම කෙරෙහි බලපාන සාධක 4ක් ලියා එය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

3. i. අභ්‍යන්තර මුහුදු කීයද? ඒ මොනවාද? (ලකුණු 04)
   ii. පෘථිවි ජල චක්‍රය රූප සටහනකින් දක්වන්න. (ලකුණු 08)
   iii. ජෛව ගෝලයේ සමතුලිතතාවය රැක ගැනීමට මිනිසා බුද්ධිමත්ව කටයුතු කල යුත්තේ ඇයිදැයි කරුණු 2ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

4. i. අ. යෝධ පැංජියා ගොඩබිම ඛණ්ඩනය වීම පිළිබඳව අදහස් දැක්වූ කල්පිතය නම් කරන්න.
   ආ. එය ඉදිරිපත් කල විද්‍යාඥයා කවුද?
   ඇ. ලෝකයේ ප්‍රධාන භූතැටි අතර ඇත්තේ එකම සාගර තැටියක් පමණි එය නම් කරන්න.
   ඉ. ශ්‍රී ලංකාව අයත් වන භූතැටිය කුමක්ද? (ලකුණු 04)
   ii. අ. හිම වැස්ම යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)
   ආ. හිමවැස්ම බහුලව දක්නට ලැබෙන ප්‍රදේශ 4ක් ලියන්න. (ලකුණු 04)
   ඇ. භූ තැටි මායිම ආශ්‍රිතව ඒවා ක්‍රියාත්මකවන ආකාරය අනුව ප්‍රධාන කලාප තුනකට වර්ග කරයි. ඒවා නම් කර ඒවායින් දෙකක ක්‍රියාකාරිත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)